පොල් වගාකිරීමේ මණ්ඩලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද රු.34,324,005 ක කෙටි කාලීන වෙන්කිරීම් ශේෂය තුළ රු.1,333,912 ක හර ශේෂයක් ද ඇතුළත් වී තිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල කෙටි කාලීන වෙන් කිරීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම ගිණුම්කරණ දෝෂ 2023 වර්ෂයේ සිදු වී ඇති අතර එහිදී මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් රු.3,806,537 ක් හා ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස වානේ ව්‍යුහමය කොටසක් එක් කිරීම වෙනුවෙන් රු.10,679,161 ක් වශයෙන් මුළු වටිනාකම රු.14,485,699 කි. ඉන් 2024 වර්ෂය තුළදී වැඩ නිම කිරීමෙන් පසු එනම් මීගමුව බීජ නිෂ්පාදන ඒකකය කාර්යාල ගොඩනැගිල්ල සඳහා රු.3,806,537 හා ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස වානේ ව්‍යුහමය කොටසක් ඉදිකිරීම සඳහා රු.9,345,249 ක් වශයෙන් මුළු මුදල රු.13,151,787 ක මුදලක් 2024 වර්ෂය තුළ පියවා ඇති අතර මෙහි දක්වන ඉතිරි ශේෂය වන රු.1,333,912 ක මුදල ප්‍රධාන කාර්යාලයේ වානේ ව්‍යුහමය කොටස වෙනුවෙන් වන අතර, 2025 වර්ෂයේ දී වැඩ නිම කළ පසු ඉතිරි මුදල පියවීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.549,966 ක් වූ වටිනා පොලි ප්‍රොපලින් බෑග් 96,596 ක් අවසන් තොගයේ ඇතුළත්ව නොතිබුණි.	පිළිගනිමි. 2024.12.31 දිනට මයිටා විද්‍යාගාර තුළ ඉතිරි වී තිබූ 549,966 ක පොලි ප්‍රොපලින් බෑග් තොග අතපසුවීමේ දෝෂයක් නිසා අවසන් තොග ගිණුමට සටහන් කර නොමැත. 2025 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී 2025.01.01 දිනට පෙර වර්ෂයට ගලපා මෙම වරද නිවැරදි කරනු ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ආ) 2024 වර්ෂයේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ගවගාලට අදාළ ඉදිකිරීම් වියදම වූ රු.633,106 ක් හා ඒ සඳහා ගවයන් දෙදෙනෙකු මිලට ගැනීමට ගෙවූ රු.325,000 ක් ගිණුම් ගත	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ සංවර්ධන වැඩසටහන් යටතේ මෙම ව්‍යාපෘතිය ඇතුළත්ව පැවතුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ගවගාල හා ජීව විද්‍යාත්මක වත්කම් යටතේ මිලදීගත් ගවයන්ගේ වටිනාකම 2025 වාර්ෂික ගිණුම්තුළ ප්‍රාග්ධනීත කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම මෙම වත්කම් පොල් සංවර්ධන පුහුණු	ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම සහ ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කළ යුතුයි.

නොකිරීම නිසා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි වටිනාකම රු.633,106 කින් හා ජීව විද්‍යාත්මක වත්කම් රු.325,000ක් අඩුවෙන් දක්වා තිබුණි.	මධ්‍යස්ථානය තුළ පවතින බැවින් එහි ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කරන ලෙස මු/3/181/ඉන්වෙන්ට්‍රි/පොදු අංක දරන ලිපිය මගින් දන්වා යවා ඇත.	
(ඇ) 2024 ජනවාරි 01 දිනට රු.72,207,279 ක් වූ පොලි බෑග්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ රු.58,597,204 ක් ලෙස දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම රු.13,610,075 ක් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි.	පිළිගනිමි. 2023.12.31 දිනට පොල්පැළ තවාන් සහ මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ ඉතිරිව තිබූ පොලිබෑග් තොග වටිනාකම තක්සේරු කිරීමේ දී 2022 වර්ෂයට අදාළ වටිනාකමට (රු.29.70) තක්සේරු කිරීම නිසා 2024.01.01 දිනට ඉදිරියට ආ ඉතිරි පොලි බෑග් තොගයේ වටිනාකම රු.21.46 ක් අඩුවෙන් 2024 වියදමට සටහන් වීම නිසා මෙම දෝෂය ඇති වී ඇත.	පොලි බෑග් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ) 2024 දෙසැම්බර් 31 දිනට පොලිබෑග් වටිනාකම රු.53,726,529 ක් වුවද රු.4,269,317 ක් ලෙස ගිණුම් ගත විම හේතුවෙන් පොලිබෑග් අවසන් තොගයෙහි වටිනාකම රු.49,457,212 අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.	පිළිගනිමි. 2024.12.31 දිනට මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ ඉතිරිව තිබූ පොලිබෑග් 630,000 ක වටිනාකම අතපසුවීමක් නිසා අවසන් තොග ගිණුමට සටහන් කර නොමැති අතර 2025 මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වර්ෂයට ගලපා නිවැරදි කරනු ඇත. තවද පොල්පැළ තවාන්වල 2024.12.31 දිනට ඉතිරි පොලිබෑග් තොග වටිනාකම වූ රු.29,333,267 ක වටිනාකම ප්‍රධාන කාර්යාල ලෙජරයට සටහන් කිරීමේ දී ගිණුම් සංකේත අංක මාරුවීමේ දෝෂය නිසා තවාන් ලෙජරයේ කඩන ලද මාළුපොල් ඉතිරි තොග ගිණුමට සටහන් වී ඇත. මේ දෝෂය නිසා තවාන් ලාභයට කිසිදු බලපෑමක් සිදු වී නොමැත. 2025.01.01 දිනට මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	පොලි බෑග් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ) 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව තිබූ පොල් වල වටිනාකම රු.1,571,237 ක් වුවද රු.30,904,504 ක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් අවසන් පොල් තොග වටිනාකම රු.29,333,267 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි	පොල් පැල තවාන්වල 2024.12.31 දිනට ඉතිරි පොලිබෑග් තොග වටිනාකම වූ රු.29,333,267 ක වටිනාකම ප්‍රධාන කාර්යාල ලෙජරයට සටහන් කිරීමේ දී ගිණුම් සංකේත අංක මාරුවීමේ දෝෂය නිසා තවාන් ලෙජරයේ කඩන ලද මාළුපොල් ඉතිරි තොග ගිණුමට සටහන් වී ඇත. මෙම දෝෂය නිසා තවාන් ලාභයට කිසිදු බලපෑමක් සිදු වී නොමැත. 2025.01.01 දිනට මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	පොල් තොග වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි.
(ඊ) 2024 දෙසැම්බර් 31 දිනට රු.623,700 ක් වටිනා කොහොඹ තෙල් අවසන් තොගය ගිණුම්ගත කර නොතිබුණි.	සුදු මැස්සාගේ හානි කළමනාකරණ ව්‍යාපෘති යටතේ මිලදී ගන්නා ලද කොහොඹ තෙල් ප්‍රාදේශීය කාර්යාල අවශ්‍යතා මත දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල වෙත බෙදා හරින ලදි. එහිදි මිලදීගත් මුළු ප්‍රමාණය වියදම් ලෙස ගිණුම්ගත වී ඇත. නමුත් සුදු මැස්සාගේ හානිය යම් ප්‍රමාණයකට පාලනය වීම මත මෙම ප්‍රමාණය භාවිතා නොකර ඉතිරි වන ලදි. එම	කොහොඹ තෙල් අවසන් තොග වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි.

	කොහොඹ තෙල් ප්‍රමාණය 2025 වර්ෂය තුළදී උතුරු පළාත කේන්ද්‍ර කර ගනිමින් සිදුකරනු ලබන පොල් දෙසතිය වෙනුවෙන් භාවිතා කිරීමට නිකුත් කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේදී එම ප්‍රමාණය වියදම් ලෙස ඇතුළත් වී නොමැත. ඒ අනුව 2024 වර්ෂය තුළ දී සිදුවූ ගිණුම්කරණ දෝෂය මත 2025 වර්ෂයේ අතිරික්තය මත බලපෑමක් ඇති නොකරයි.	
(උ) 2024වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන් තුළ දක්වා ඇති පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් කුලියාපිටිය, කෑගල්ල, කළුතර, මාතර ,මාතලේ යන ප්‍රාදේශීය කාර්යල හා නිල නිවාස ඉදිකර ඇති අක්කර 02 රූඩ් 01 පර්චස් 34.4 ක ඉඩම් ගිණුම්ගත කර නොතිබුණි.	ඒ වන විටත් මණ්ඩලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට වැයවන මුදල පිළිබඳව දළ ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත ලිපියක් යොමුකර ඇත. දළ ඇස්තමේන්තුව ලැබුණු පසු ඒ පිළිබඳව විගණකාධිපති වෙතින් උපදෙස් ලබාගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	කුලියාපිටිය, කෑගල්ල, කළුතර, මාතර ,මාතලේ යන ප්‍රාදේශීය කාර්යල හා නිල නිවාස ඉදිකර ඇති ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය.
(ඌ) 2023 දෙසැම්බර් 31දිනට රු. 274,553,043 ක් වූ ප්‍රති මූල්‍ය ණය ශේෂය මත මූල්‍ය ආයතන 5 ක් විසින් මණ්ඩලය වෙත තැන්පත් කළ යුතු ඇප ආවරණ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් තැන්පත් කර නොතිබූ රු.1,314,286 ක් වූ මුදල ගිණුම්ගත කර නොතිබූ අතර එම නිසා ලැබිය යුතු ඇප ආවරණ හා ඇප ආවරණ අරමුදල රු.1,314,286 කින් අඩු වී තිබුණි.	ඇප ආවරණ ණය ගිවිසුම් ප්‍රකාරව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කප්රුක ආයෝජන ඇප ආවරණ වැඩසටහන යටතේ වූ ඇප ආවරණ වාර්ෂික ගෙවීම් පවතින සත්‍ය ණය ශේෂයෙන් (බැංකුවල සත්‍ය ලෙස පවතින ප්‍රතිලාභී ණය ශේෂ මත) 0.5 % ක් ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඇප ආවරණ ගිණුමට යොමු කළ යුතුය. එනමුත්, මූල්‍ය ආයතන විසින් ඇප ආවරණ වාරික ගෙවීමේ අවිධිමත්භාවය නිසා එළඹෙන වර්ෂයේ ඇප ආවරණ වාරික වාර්ෂිකව ජනවාරි 15 ට පෙර පොල් වගාකරීමේ මණ්ඩලයේ ඇප ආවරණ ගිණුම්වලට යොමු නොවන අවස්ථා තිබේ. මේ පිළිබද බැංකු ආයතන වරින්වර දැනුවත්කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේ අදාළ වාර්ෂික ඇප ආවරණ වාරික හිඟ මුදල් බොහෝ මූල්‍ය ආයතන තුළින් ජනවාරි මාසය තුළ ඇප ආවරණ ගිණුම් වලට තැන්පත් කිරීමට කටයුතු කර ඇති බැවින් මෙම ගැටළුව ඉදිරියේ දී මග හරවා ගත හැකි බව තහවුරු වේ.	අදාළ මූල්‍යායතන සමඟ සාකච්ඡා කර ගිවිසුම ප්‍රකාරව කටයුතු කර ලැබිය යුතු මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි.

1.6 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)2024 අගෝස්තු 13 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 25 (2)	ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනය කිරීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව	මෙම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රු.මි.6.5 ක් ලෙස සංශෝධනය විය යුතු අතර මහයාය ආදර්ශ පොල් උයනට අනුයුක්තව පවත්වාගනෙ යනු ලබන කප්තුරුපාය වෙළෙඳසැලට අදාළ ස්ථාවර තැන්පතුවේ ආරම්භක වටිනාකම රු.6,500,000	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුය.

	සමාලෝචිත වර්ෂයේදී මහයාය කප්තුරුපාය වෙළඳසැල විසින් රු.6,500,000 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.	කි. මහයාය කප්තුරුපාය වෙලඳසැලට අදාළ ජංගම ගිණුමේ 2024.01.23 වන විට රු.මි.6.5 ක අතිරික්තයක් පැවති අතර මෙම මුදල් තවදුරටත් ජංගම ගිණුමේ තබාගැනීමෙන් ඒ වෙනුවෙන් ලබාගත හැකි ආයෝජන ආදායම් අහිමි වී යන බැවින් 2024.01.23 පැවති 621 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ පදනම මත මෙම මුදල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. FM/FD/Kapthurupaya-MAH හා 2025.06.05 දිනැති ලිපිය මගින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද ලිපිය මගින් භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා ඇත.	
(ආ) 2022 මැයි 10 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක CCB/CR/lu/CMC & ND/2022-01	මණ්ඩලයේ පොල් උයන්වල වැටෙන පොල්වල අස්වැන්න මුළු ඵලදාවෙන් සියයට 10 නොඉක්මවන ලෙස කටයුතු කළ යුතු වුවත් මණ්ඩලය පවත්වාගෙන යන ආදර්ශ පොල් උයන්වල වැටුණු පොල් ප්‍රමාණය සියයට 12 ත් සියයට 17 ත් අතර පැවතුණි.	2025.05.27 දින පැවති 634 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා යොමුකරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා ආදර්ශ පොල් උයන්වල පොල් අස්වැන්න නෙලීම සඳහා දැනට පවතින මාසික අස්වනු නෙලීම අහෝසි කර දින 45 කට වරක් පොල් අස්වනු නෙලීම සඳහා සහ එසේ දින 45 කට වරක් පොල් කැඩීමේ දී වැටුණු පොල් ප්‍රතිශතය සියයට 10 ක මට්ටෙම් සිට සියයට 20 ක උපරිමයක් දක්වා ඉහළ නැංවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාස 06 ක අධීක්ෂණ කාලයකට යටත්ව අනුමත කර ඇත. ඒ අනුව, අප මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන්වල වැටුණු පොල් ප්‍රතිශතය සියයට 20 ක සීමාවේ පවත්වාගෙන යනු ලබයි.	අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ) 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි 02 වගන්තිය, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි 2.3 ඡේදය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 මාර්තු 20 දිනැති අංක PED/P/02/15 (i) temp 3	පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු සඳහා රු.59,650 ක මාසික දීමනාවක් සමඟ වෙන්කල වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 115 ක් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මාසික දීමනාව, ඉන්ධන දීමනාව, අනුයුක්ත කළ රියදුරු අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු.948,394 ක් ගෙවා තිබුණි.	වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අංක MPI/Admin/12/BM/CCB (Temp) හා දිනැති ලිපිය මගින් සංශෝධිත 2022.10.12 2 පොල් සංවර්ධන පනතේ A (1) යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ක්‍රියාකාරී අධ්‍යක්ෂක ධුරය සඳහා පත්කිරීමක් පනතෙහි 10.2 (ix) අ වගන්තිය පරිදි සිදු කර ඇත. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 හි 2 වගන්තිය ප්‍රකාරව මාසික දීමනාවක්ද, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා 1999.10.08 හි 1;1;6 (iii) උප වගන්තිය අනුව නිල වාහනයක් අනුයුක්ත කිරීමේ හැකියාවක් පවතින බැවින් අදාළ පත්කිරීම, දීමනා සහ නිල වාහනයක් ලබාදීම අමාත්‍යාංශය මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ප්‍රකාරව සිදු කර ඇත. කෙසේ වුවද මෙම මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධුරය සඳහා පත්කර සිටි නිලධාරියා	යොමුගත චක්‍රලේඛ හා ලිපි අනුව අනුමත නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීම් නොකළ යුතුය.

දරන ලිපිය		2024.09.11 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇත.	
(ඈ) ආයතන සංග්‍රහය XXVIII වැනි පරිච්ඡේදයේ 1.3 වගන්තිය	සෑම රජයේ කාර්යාලයකම පැමිණීමේ ලේඛනයක් තබාගත යුතු වුවද පොල් සංවර්ධන නිලධාරීන් විසින් තම කොට්ඨාස කාර්යාලයට වාර්තා කරන දිනයන්හි පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවතින නමුත් එම ලේඛනය අත්සන් කිරීම නිලධාරීන් විසින් පැහැර හැර තිබුණි.	පොල් සංවර්ධන නිලධාරීන් ක්ෂේත්‍ර නිලධාරීන් වන අතර සඳුදා දින ඔවුන්ගේ කාර්යාල දිනය වේ. පොල් සංවර්ධන නිලධාරින් විසින් ලබාදෙන ඉදිරි වැඩසටහන් වාර්තාවෙහි ක්ෂේත්‍ර රාජකාරී සම්බන්ධව හා කාර්යාලීය දිනය පිළීබඳව සඳහන් කරන නමුත් කාර්යාලීය දිනයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් නඩත්තු කළ යුතුය. ඇතැම් ප්‍රාදේශීය කාර්යාලවල පොල් සංවර්ධන නිලධාරීන් විසින් එම ලේඛනය නිසි පරිදි නඩත්තු නොකරන බව වාර්තා වී ඇති නමුත් ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය කළමනාකරුවන් මගින් පොල් සංවර්ධන නිලධාරීන් වෙත දැනුම් දී ඇති පරිදි ඉදිරියේ දී සියලුම පොල් සංවර්ධන නිලධාරීවරු තම කාර්යාලය තුළ පැමිණීමේ හා පිටවීමේ ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කරනු ඇති අතර ප්‍රාදේශීය කළමනාකරු විසින් ඒ සම්බන්ධව නිවැරදිව අධීක්ෂණය කරනු ඇති බව තහවුරු කළ හැකිය.	ආයතන සංග්‍රහයේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) මු.රෙ 102	මණ්ඩලයේ ප්‍රධාන ගබඩාව භාරව 2021.10.25 දින සිට 2023.07.24 දින දක්වා සේවය කළ සේවකයකු විසින් රු.16,663,700 ක් පිරිවැය වූ ඩෙල් ලැප්ටොප් යන්ත්‍ර 37 ඩයනා බුක් ලැප්ටොප් 39 ක් හා ටැබ් යන්ත්‍ර 24 ක් එක් එක් අංශ හා ප්‍රාදේශීය කාර්යාල අතර බෙදාහැර තිබූ අතර 2022 වර්ෂයේදී කළ භාණ්ඩ සමීක්ෂණයේදී රු.910,800 ක් වටිනා ලැප්ටොප් යන්ත්‍ර 4 ක් හා ටැබ් යන්ත්‍රයක් ඌණතාවයක් වාර්තා වී තිබුණත් ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට මෙම යන්ත්‍ර වල වර්තමාන	මෙම අස්ථානගත වී ඇති ලැප්ටොප් යන්ත්‍ර 4 හා ටැබ් යන්ත්‍ර 1 භාවිතා නොකළ නව මිලදී ගත් අයිතම වන අතර එම අවස්ථාවේම එම සේවකයා විසින් වරද පිළිගැනීම මත හා වෙළඳපල වටිනාකම ගෙවීමට එකග වීම මත මු.රෙ. පරීක්ෂණයක් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නොනැගුණි. ඒ අනුව මුලු වෙළඳපල වටිනාකම මේ වන විට වැටුපෙන් අයවෙමින් පවතින බව ප්‍රකාශ කර සිටිමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	වටිනාකම රු.1,071,555 ක් ලෙස තක්සේරු කර සේවකයාගේ වැටුපෙන් මසකට රු.15,000 බැගින් අය කිරීමේ ක්‍රමයක් කළමනාකරීත්වය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ඉන්වෙන්ට්‍රි අයිතම 5 අස්ථානගත වී වසර 4 ක් ගතවී තිබුණද භාණ්ඩ අස්ථානගත වීමේ වගකීම තමන් භාරගන්නා බව දන්වා තිබියදීත් සේවකයාට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නොතිබුණි.		
(ii) මු.රෙ 571	ප්‍රධාන කාර්යාලයේ රු.3,533,782 ක් වූ අතරැඳවුම් මුදල් වසර 4 – 5 ත් අතර කාලයක් නිරවුල් නොකර හෝ ආදායමට නොගෙන පැවතුණි.	පොළොන්නරුව සංචාරක නිවාසයේද, යාපනය කලාප කාර්යාලයේද, මාතලේ කලාප කාර්යාලයේද ඉදිකිරීම් කටයුතු වලට අදාළ රැඳවුම් මුදල් ගෙවීම් අත්හිටුවා ඇති නිසා මෙම මුදල් තාවකාලිකව රදවා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඊ)2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය	රාජ්‍ය ආයතනවල මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2024 මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2025 අප්‍රේල් 30 දිනදීය.	නැවත මෙවැනි ප්‍රමාදයන් සිදු නොවීමට කටයුතු කරන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර වසරකට වඩා වැඩි කාලයක් පුරප්පාඩුව පැවතීම නිසා එක් එක් අංශ සම්බන්ධීකරණය කර ගැනීමේ අපහසුතාවක් පැන නැගුණි.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ වගන්තිය ප්‍රකාරව වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 105,537,456 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපී ඉකුත් වර්ෂයේ ඌණතාවයක රු. 62,743,429 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 168,280,885 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ ලැබීම් හා වෙනත් ආදායම් පිළිවෙලින් රු.72,857,261 කින් හා රු.502,087,198 කින් අඩුවීමත් විශේෂ ව්‍යාපෘති වියදම් හා තවාන් වියදම් පිළිවෙලින් රු.69,905,992 කින් හා රු.681,334,302 කින් අඩු වීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි වේ.

විෂයය	2024 වර්ෂය රු.	2023 වර්ෂය රු.	විචලනය රු.	විචලනය ප්‍රතිශතයක් ලෙස සියයට
<u>ආදායම්</u>				
භාණ්ඩාගාර ලැබීම්	1,137,500,000	975,528,021	161,971,979	17
අමාත්‍යාංශ ලැබීම්	61,369,025	134,226,286	(72,857,261)	(54)
වෙනත් ආදායම්	914,597,911	1,416,685,109	(502,087,198)	(35)
<u>වියදම්</u>				
සංවර්ධන වැඩසටහන් වියදම්	476,446,085	472,040,263	4,405,822	1
විශේෂ ව්‍යාපෘති වියදම්	44,538,842	114,444,834	(69,905,992)	(61)
වැටුප් හා දීමනා	479,065,710	456,066,871	22,998,839	5
තවාන් වියදම්	278,615,493	959,949,795	681,334,302	71
ක්ෂය හා ක්‍රම ක්ෂය වියදම්	138,136,584	82,647,065	55,489,519	67
කප්රුක ආයෝජන අරමුදල් වියදම්	22,956,408	28,054,451	5,098,043	18
වෙනත් වියදම්	151,676,341	119,910,849	31,765,492	26

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 9 : 1 ක් හා 6 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් පිළිවෙලින් 7 : 1 ක් හා 5 : 1 ක් විය. 2023 හා 2024 වර්ෂයන්හි තොගය පිළිවෙලින් රු.514,593,147 ක් හා රු.618,452,497 ක් ද කෙටිකාලීන ආයෝජන පිළිවෙලින් රු.904,068,523 ක් හා රු. 639,215,445 ක්ද වීම ජංගම හා ක්ෂණික වත්කම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2023 ජූලි 06 දින පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ 09 න් පහත සඳහන් නිර්දේශ 06 ක්ම ක්‍රියාත්මක කර නොතිබුණි.		
(i) සුදු මැස්සා හානිය පාලනය කිරීම සඳහා ගනුලබන ක්‍රියාමාර්ග සති 2 ක් ඇතුළත එනම් 2023 ජූලි 20 දිනට පෙර රාජ්‍ය	සුදු මැස්සා වැනි හදිසි ආපදා තත්ත්ව සඳහා මුහුණ දීමට පිහිටුවන ලද ආපදා කළමනාකරණ සභාවේ	රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ

	ව්‍යාපාර කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මධ්‍යස්ථානය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන හදිසියේ සපයා ගැනීමට ආරක්ෂිත අරමුදලක් පිහිටුවීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙතින් ඉල්ලා ඇති අතර, ඒ සඳහා කෘෂිකර්ම සහ විවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ගේ අංක MAPI/PD//PLN/04/Project Pro/Coco හා 2024.08.26 දිනැති ලිපිය මගින් අනුබද්ධ ආයතනය සඳහා අනපේක්ෂිත ආපදා තත්ත්වයන් පාලනය කිරීම සඳහා අමාත්‍යාංශයේ අරමුදලක් රඳවා තබා ගැනීමට මහ භාණ්ඩාගාරයෙන් අනුමැතිය නොලැබෙන බව දන්වා ඇත. එම නිසා පොල් වගාවේ ආපදා තත්ත්වයන් පාලනය සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනාවක්, අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය අනුව සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඒ සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. ඒ අනුව සුදුසු ආරක්ෂිත අරමුදලක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීමේ හැකියාවක් ලැබී නොමැත.	ක්‍රියාත්මක කළ යුතුයි.
(ii)	පොල් වගාව සහිත ඉඩම් කැබලි කිරීම වැළැක්වීමට වහාම අවශ්‍ය පියවර ගෙන සති 2 ක් තුළ රාජ්‍ය ව්‍යාපාර කමිටුව දැනුවත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පොල් වගාව සහිත ඉඩම් කැබලි කිරීම වැළැක්වීමට වහාම අවශ්‍ය පියවර ගෙන සති 2 ක් තුළ කමිටුව දැනුවත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කර තිබුණද ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් කටයුතු කලේද යන්න මණ්ඩලයට දන්වා නොතිබුණි. මේ සම්බන්ධයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීතුමාගේ අංක EXT/DEV/FSD/13-(වෙළුම IV) දරන 2025.05.20 දිනැති ලිපිය මගින් උක්ත ප්‍රශ්නය සම්බන්ධයෙන් විගණන අංශයට තොරතුරු ලබාදෙන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරන ලදි. නමුත් අමාත්‍යාංශය විසින් මේ වන තෙක් එකී ප්‍රශ්නය සම්බනධයෙන් පිලිතුරක් ලබා දී නොමැත.	රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයි.
(iii)	මීගමුව බීජ පොල් ඒකකය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.2,149,974 ක් උපදේශක සමාගමකට 2016 වර්ෂයේදී සේවා සැපයීමකින් තොරව ගෙවීම සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් කමිටුව වෙත මසක් තුළ ලබාදෙන ලෙස අමාත්‍යාංශ ලේකම්ට කළ නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.	මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම මීගමුව මහ නගර සභාව විසින් සිදුකළ අතර, එහි අලුත්වැඩියා කටයුතු උපදේශන සමාගමක් මගින් සිදුකර නොමැති බැවින් මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කාර්යයට අදාළව මේ දක්වා කිසිදු උපදේශන ගාස්තුවක් ගෙවා නොමැත. කෙසේ වෙතත් මෙම විගණන විමසුම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් තොරතුරු ලබාගත යුතු අතර අමාත්‍යාංශය මගින් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත දැනුම් දීමක් සිදු කර නොමැත. මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී අමාත්‍යාංශයෙන් විමසීමට කටයුතු කරමි.	රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයි.

(iv)	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොල් වගා කිරීමේ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 27 දෙනෙකුට රු.17,186,549 ක් කම්කරු දීමනා වශයෙන් බෙදා දීම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ට මු.රෙ.119 ප්‍රකාර කටයුතු කර අයකරගත යුතු බවට නිර්දේශ කර තිබුණත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම කම්කරු දීමනාව නැවත අයකර ගැනීම වැළැක්වීම සම්බන්ධයෙන් අගතියටපත් පාර්ශවය විසින් එම දීමනාව නැවත 2023.07.04 වන දින අය කිරීම වැළැක්වීම සම්බන්ධව අධිකරණයේදී CA (Writ) 23/214 අංක දරන නඩුකරයක් ගොනුකර ඇත. නීතිපතිදෙපාර්තුමේන්තුව විසින් අංක CA/CA/510/2023(R) හා 2023.09.08 දිනැති ලිපිය මගින් අගතියට පත් පාර්ශවයෙන් කිසිදු අඩු කිරීමක් නොකරන ලෙසට දන්වා ඇත. එම නඩුව මේ වනවිටත් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හරහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත වර්තමාන තත්ත්වය පිළිබඳව විමසීම් ඉදිරිපත් කර ඇත. අවසන් වරට ලද ලිපිය අනුව 2025.06.30 දිනට මෙම නඩුව කැඳවන බව නීතිපති දෙපාර්තමේන්තුව මගින් දුරකථන මාර්ගයෙන් දැන්වූ අතර, එම නඩුව මේ වන විට සාක්ෂි විමසන අවධියේ පසුවන බවත්, සංවාද අවධියට පැමින නැති බවත්, මේවන විට නඩුකරය මෙහෙයවනු ලබන නීතිඥවරිය විසින් ප්‍රකාශ කරන ලදි. පොල් වගාකිරීමේ මණ්ඩලයට අධිකරණය විසින් කිසිදු කැදවීමක් මේවන තෙක් ලැබී නොමැත.	රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයි.
(v)	පොල් සංවර්ධන ජනතා වතු අමාත්‍යාංශයට පෞද්ගලික සමාගම් 2 කින් ලැබිය යුතු රු.6,573,572 ක් අය නොවී පැවතුණි. එම මුදල අයකර ගැනීම සඳහා සුදුසු පියවරක් ගෙන මසක් ඇතුළත කමිටුවට දන්වන ලෙස අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කර තිබුණත් මේ දක්වා එසේ කටයුතු කර නොතිබුණි. 2025 ජූනි 24 දිනැතිව මණ්ඩලයේ සභාපති එවා තිබූ පිළිතුර අනුව 2022 වර්ෂයේදී කපා හැරීමට කටයුතු කර තිබුණද එසේ කපා හැරීමට ලබා ගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර 2023 ජුලි 6 දින පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදී ද ඒ බව ප්‍රකාශ කර නොතිබුණි.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ උපදෙස් අනුව 2014 වර්ෂයේ සිට ණයගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.6,573,572 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් කපාහැරීම සඳහා 2023.06.27 දින පැවැත්වූ 614 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන 2022.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් කපාහැරීම සඳහා කටයුතු කරන ලදි.	රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයි.
(vi)	පොල් වගාකිරීමේ මණ්ඩලයට අනුයුක්තව සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක සඳහා බද්දට ගත් නිවසක් සහ ඒ සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් වැය වූ මුදල් ඇයගෙන් අයවිය යුතු වුවත් එම මුදල් නිලධාරිනියගෙන්	හිටපු සාමාන්‍යාධිකාරිනියගේ ප්‍රයෝජනය සඳහා නිවසක් කුලියට ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය වෙතින් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් පිලිතුරක හෝ වෙනත් ප්‍රගතියක් ඇත්නම් දැනුම් දෙන ලෙස දන්වා අමාත්‍යාංශය වෙත 2025.04.03 දිනැතිව ලිපියක්	රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයි.

අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතර වර්තමානයේ සේවය කරන ස්ථානයෙන් අයකරවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කර තිබුණත් මේ දක්වා ඒ සඳහා කටයුතු කර නොතිබුණි.	මගින් දන්වා ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් සිදු කරන ලද විමසීමක් සම්බන්ධයෙන් එම ආයතනය වෙත පිලිතුරු වශයෙන් යොමුකළ 2025.06.16 දිනැති ලිපියක පිටපතක්ද අප වෙත යොමු කර ඇත. අදාළ නිලධාරිනිය රාජ්‍ය පරිපාලන සේවයේ නියුතු බැවින් ඉදිරි කටයුතු රාජ්‍ය පරිපාලන, පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය වෙතින් සිදු කරනු ඇත.	
(ආ) වසර 5කට වඩා වැඩි කාලයක් ඉකුත් වූ රු.2,308,029 ක ණයගැති ශේෂ 4ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි.	වෙස්ටර්න් බ්‍රෝකර්ස් සහ ඩබ්.ටී.වාස් සහ සමාගම්වලින් පිළිවෙලින් අයවිය යුතු රු.1,176,375 ක සහ රු.1,042,378 ක මුදල මණ්ඩලය වෙත නොගෙවීම සම්බන්ධයෙන් එම සමාගම් 2 කට එරෙහිව නඩු පවරා ඇති අතර එම නඩු සම්බන්ධ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. මිල්ලවාන වැවිලි සමාගමෙන් සහ වැවිලි අමාත්‍යාංශයේ සුබ සාධක සංගමයෙන් පිළිවෙළින් අයවිය යුතු රු.11,900 ක සහ රු.77,376 ක මුදලෙහි එකතුව වන රු.89,276 ක මුදල අවුරුදු 10 කට අධික කාලයක් තිස්සේ ඉදිරියට එන ගිණුම් ශේෂයකි. මේ පිළිබඳව තොරතුරු සොය බැලුවද ප්‍රමාණවත් තොරතුරක් සොයා ගැනීමට නොහැකි විය. එම නිසා ඉදිරි විගණන කළමනාකරණ කමිටුවේ නිර්දේශ යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට මූල්‍ය රෙගුලාසි අනුව ලියා හැරීමට කටයුතු කරනු ලැබේ.	ණය ගැති ශේෂ අයකර ගත යුතුය.
(ඇ) කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.9,953,712 ක මුදලක් වසර 4- 5 ත් අතර කාලයක සිට නිරවුල් නොවී පැවතුණි.	රු.6,683,533 ඉදිකිරීම් සම්බන්ධයෙන් පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීමට හා ගෙවීම් වටිනාකම් සම්බන්ධයෙන් පවත්නා ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර අදාළ ගැටළු නිරාකරණය කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරුට ගෙවීම හිමි වේ නම් විධිමත් පරිදි ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. රු.267,030 රඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍ය නිර්දේශ ප්‍රදේශයේ තාක්ෂණික නිලධාරීවරයෙකුගෙන් ලබාගෙන ඉදිරි කටයුතු විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු කරනු ඇත.	පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීමෙන් පසු රඳවාගත් මුදල් ගෙවීමට කටයුතු කළ යුතුයි.
(ඈ) සේවය හැර ගිය සේවකයන් 42 කුගෙන් අයවිය යුතු රු.3,044,097 ක	අවුරුදු 1 - 5 දක්වා හිඟව පවතින අතර ඔවුන් වෙත දැනුම්දී ඇත.	හිඟ සේවක ණය අයකර ගැනීමට

මුදලක් අවුරුදු 1සිට 5 දක්වා හිඟව පවතින අතර එම ණය අයකර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.
(ඉ) කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයට අදාළ ඇප ආවරණ ගිවිසුමෙහි 3.11 ප්‍රකාරව වගාකරුවන් වෙත ණය පහසුකම් සපයා ඇති මූල්‍ය ආයතන වෙතින් දෙසැම්බර් 31 දිනට අය විය යුතු ප්‍රතිමූල්‍ය ණය ශේෂ මත සියයට 0.5 ක් වූ වටිනාකමක් 2024 ජනවාරි 15 හෝ ඊට පෙර මණ්ඩලයේ ඇප ආවරණ සඳහා පවත්වාගෙන යනු ලබන ඉතුරුම් ගිණුමෙහි තැන්පත් කළ යුතුය. මූල්‍ය ආයතන විසින් අදාළ ඉතුරුම් ගිණුමෙහි තැන්පත් කළ යුතු රු.2,852,955 ක ඇප ආවරණ වටිනාකම ගිවිසුම් ප්‍රකාරව තැන්පත් කර ගැනීමට මණ්ඩලය ක්‍රියාකර නොතිබුණි. මේ හේතුවෙන් ඇප ආවරණ ඉතුරුම් ගිණුමේ ශේෂ මත මණ්ඩලයට උපයා ගත හැකිව තිබූ පොළී ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.	මූල්‍ය ආයතන විසින් ඇප ආවරණ වාරික ගෙවීමේ අවිධිමත්භාවය නිසා එළඹෙන වර්ෂයේ ඇප ආවරණ වාරික වාර්ෂිකව ජනවාරි 15 ට පෙර පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඇප ආවරණ ගිණුම්වලට යොමු නොවන අවස්ථා තිබේ. මේ පිළිබඳ බැංකු ආයතන වරින් වර දැනුවත් කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේ අදාළ වාර්ෂික ඇප ආවරණ වාරික හිඟ මුදල් බොහෝ මූල්‍ය ආයතන තුලින් ජනවාරි මාසය තුළ ඇප ආවරණ ගිණුම්වලට තැන්පත් කිරීමට කටයුතු කර ඇති බැවින් මෙම ගැටළුව ඉදිරියේ දී මගහරවා ගත හැකි බව තහවුරු වේ.	මූල්‍යායතන සමග සාකච්ඡා කර ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඊ) ක්‍රමානුකූල පොල් වගාවක් සඳහා 2018 වර්ෂයේදී රු.1,600,000 ක් වියදම් දරා ජංගම දුරකථන යෙදුමක් නිර්මාණය කර තිබූ අතර, 2025 පෙබරවාරි 03 දින වන විටත් අවසන් යාවත්කාලීන කිරීම වශයෙන් සටහන්ව තිබුණේ 2024 අගෝස්තු 03 දින විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම මෘදුකාංගය සඳහා වූ බාගත කිරීම් ප්‍රමාණය 10,000 කට වඩා වැඩි ප්‍රමාණයක් බව දැක්වුවද මෘදුකාංගය පොල් වගා කරන්නන් අතර ප්‍රචලිත කිරීමට සහ යාවත්කාලීන තොරතුරු ලබා දීමට මණ්ඩලය කටයුතු කර තිබුණේද යන්න ගැටලුවක් විය.	මෙම ජංගම යෙදුම මගින් පොල් වගාව සම්බන්ධයෙන් වගාකරුවන් වෙත එදිනෙදා ජීවිතයේදී අවශ්‍ය කරන තාක්ෂණික කරුණු පිළිබඳ දැනුම ලබාදීම සිදුකරයි. මෙහි අවසන් යාවත්කාලීන කිරීම 2024 අගෝස්තු මස 03 වන දින සිදුකර ඇති බව දක්වා ඇත. කෘෂිකර්මාන්තයට අදාළ වන මෙවැනි ජංගම යෙදවුම් යාවත්කාලීන කරනු ලබන්නේ හදිසි තත්ත්වයක්, යම් වසංගත රෝගයක් සීඝ්‍රයෙන් ව්‍යාප්තවන තත්ත්වයක් හෝ යම් සුවිශේෂ කරුණක් සම්බන්ධ තොරතුරු පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය වූ අවස්ථාවන්හිදී පමණි. ඒ අනුව අවසන් වරට 2024.08.13 දින මෙම ජංගම යෙදවුම යාවත්කාලීණ කර අත්තේ එම කාලයේදී රට තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ සුදු මැස්සා හානිය පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම සඳහාය.	ජංගම දුරකථන යෙදුම ඉතා ඵලදායී තොරතුරු සැපයුම් මාර්ගයක් වන බැවින් තවදුරටත් ප්‍රචලිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගත යුතුය.
(උ) මණ්ඩලය විසින් පවත්වාගෙන යන ආදර්ශ පොල් උයන් 12 හි පාලු පැළ සිටුවීම පිළිබඳ පරීක්ෂාවේදී මහයාය, බෝපිටිය, රන්දෙනිය, නාගන්සෝල සහ කොරෙයි යන පොල්උයන්වල සමාලෝචිත වර්ෂයේදී සිටුවා ඇති පාලු පැල ප්‍රමාණයට වඩා වැඩි පාලු පැල	ආදර්ශ පොල් උයන් පිහිටි ප්‍රදේශයන්හි පැවති වර්ෂාපතනය සහ කම්කරු සුලභතාවය අනුව පාලු පැළ සිටුවීම සිදුකරන බැවින්, එක් වර්ෂයකදී විශාල පාලු පැළ ප්‍රමාණයක් සිටුවා නඩත්තු කිරීම අපහසු වන බැවින් ක්‍රමානුකූලව පාලු පැළ සිටු වීම සිදුකරනු ලබයි. විශේෂයෙන් පලෙයි ආදර්ශ පොල් උයනට අයත්	පාලු පැල සිටුවීම සඳහා එක් එක් පොල් උයන්වල අඩුපාඩු සොයා බලා ඇස්තමේන්තු කර අරමුදල් සපයා ගැනීමට කටයුතු

ප්‍රමාණයක් තව දුරටත් සිටුවිය යුතු විය. 2024 දෙසැම්බර් 31 දිනට තව දුරටත් සිටුවිය යුතු ප්‍රමාණය පැල 150 සිට 2537 දක්වා පරාසයක පැවතුණි.	කරන්දායි ඉඩම් කොටසේ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් පැවති නඩු කටයුතු හේතුවෙන් එහි සංවර්ධන කටයුතු සිදුකිරීමට නොහැකි තත්ත්වයක පැවතුණි. එම නිසා පාලු පැල සිටුවීමද ප්‍රමාද විය. මේ වන විට නඩු කටයුතු අවසන් වී ඇති බැවින්, පාලු පැල සිටුවීමේ කාර්යයද ආරම්භ කර ඇති අතර, මේ වන විට ක්‍රමානුකූලව සිදු කරගෙන යමින් පවති. තවද මහයාය ආදර්ශ පොල් උයනේ සත්ව පාලන ව්‍යාපෘති (උදා - මී ගව ව්‍යාපාතිය) පවත්වාගෙන යන ක්ෂේත්‍රවල පාලු පැල සිටුවීම කොටස් වශයෙන් සිදුකරන බැවින් එකවර පාලු පැල සිටුවා අවසන් කිරීමේ හැකියාවක් නොමැති වී ඇත.	කළ යුතුයි.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2016, 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂ වලදී මිලදී ගත් මුද්‍රණ යන්ත්‍ර සඳහා භාවිතා කරන රු.675,517 ක වටිනාකමකින් යුතු ටෝනර් 58 ක් සහ 2017 සහ 2021 වර්ෂ වලදී රු.26,270 ක වටිනාකමකට මිලදී ගත් විද්‍යුත් මල්ටිමීඩියා තිර 03 ක් ප්‍රයෝජනයට නොගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවතුණි.	මල්ටි මීඩියා තිර 03 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ, ව්‍යාප්ති හා සංවර්ධන අංශවල ඉල්ලීමට අනුව එම අංශවලටත් අම්පාර ප්‍රාදේශීය කාර්යාලයටත් නිකුත් කර ඇත. නිකුත් කිරීමේ නිවේදන අංක S/10/38,S/10/48,S/10/37 භාවිතයට නොගෙන ගබඩාකර ඇති ටෝනර් මිලදීගත් කාලවකවානුවේදී යොදාගත හැකි මුද්‍රණ යන්ත්‍ර ආයතනය සතුව පැවති අතර, එහිදී එම මුද්‍රණ යන්ත්‍ර සඳහා අවශ්‍යතාවය අනුව නිකුත් කිරීමට මිලදීගත් ඒවා වේ. කාලීණව මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම හා අබලන්වීම මත භාවිතයෙන් ඉවත් කිරිම හේතුවෙන් මෙම තොගය ඉතිරි වී ඇත.	අවශ්‍යතාවයන් පරිදි භාණ්ඩ මිලදී ගැනීම් සිදු කළයුතු අතර මිලදී ගත් භාණ්ඩ බෙදාහැරීම ද නියමිත පරිදි සිදු කළ යුතුය.